**Singhalese - Postpartum Hair Loss**

වැඩිහිටියන්ගේ ස්වභාවය



# කෙස් හැලීම

## වැදගත් කරුණු

- **Postpartum** කෙස් හැලීම ස්ථිරවම කෙස් හැලීමක් නොවේ
- සාමාන්‍යයෙන් හිසකෙස් සමේ, කෙස් 100,000 පමණ වැඩෙන අතර දිනපතා කෙස් 50-200 අතර ප්‍රමාණයක් හැලේ.
- ගර්භනීය අවස්ථාවේදී වැඩිවන හෝමෝනය මට්ටම හේතුකොටගෙන හිසේ සමේ **(scalp)** කෙස් වැඩීම සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩිය.
- දරුවා බිහිකිරීමෙන් පසු හෝමෝන මට්ටම සාමාන්‍ය බවට පත් වන බැවින් මාස දෙක තුනකට පසුව කෙස් හැලීම වැඩිවන අතර එය මාස දෙක තුනකට පවතී.
- කෙස් හැලීම පටන්ගෙන මාස තුනේ සිට මාස හයකට පසුව සාමාන්‍ය කෙස් වැඩීම පටන් ගනී.
- සෑම ගර්භනීය අවස්ථාවකදීම **Postpartum** කෙස් හැලීම හටගනී.

## එවා මොනවාද?

ගර්භනීය අවස්ථාවත් සමගම ස්ත්‍රීන් බොහෝ දෙනෙක් තමන්ගේ කෙස් හැළෙන බව දකී. ගර්භනීය අවස්ථාවේදී වැඩිවන හෝමෝන් ප්‍රමාණය හේතුකොට ගෙන සමේ සහ ශරීරයේ සෙසු බොහෝ කොටස් වලද වෙනස් කම් ඇතිවේ. කෙස් වැඩීමේ චක්‍රයේ අවස්ථාවට හිසේ සමේ සියලුම කෙස්ද යොමු කරයි. එයින් තේරුම් ගත හැක්කේ ගර්භනීය අවස්ථාවේදී තම කෙස් ඝණව වැඩෙන බව බොහෝ ස්ත්‍රීන් දකින බවයි.

බිළිඳා උපන් පසු කෙස් වැඩීම බෙහෙවින්ම නැවති විවේකී අවස්ථාවකට පැමිණ මාස දෙකක් හෝ තුනක් ගත කරයි. කේස චක්‍රය නැවත පටන් ගත් පසු කෙස් වැඩීමේ අවස්ථාවට පැමිණ පරණ කෙස් වහා හලා දමති. හලා දමන  ප්‍රමාණය එක් එක් අයට වෙනස් වන අතර සමහර ස්ත්‍රීන්ගේ කෙස් අන් අයට වඩා හැලෙන බව දකිණු ඇත. තමාගේ පවුලේ කෙස් අඩුවීම උරුමයෙන් පවත්නා දෙයක් නම් දරු උපතකින් පසුව එය වඩාත් දැකිය හැක.

Postpartum කෙස් හැලීම සාමාන්‍යයෙන් මාස දෙක තුනක් පවතින අතර කෙස් නැවත වැඩීමට පටන් ගන්නා අතර බොහෝ ස්ත්‍රීන් ගේ කෙස් පෙර ගර්භනීය තත්වයට පත්වේ.

## ඊට ප්‍රථිකාර කරන්නේ කෙසේද?

Postpartum කෙස් හැලීමට ප්‍රථිකාරයක් අවශ්‍ය නැත. එය හුදෙක් ගර්භනීය අවස්ථාවේදී ඇතිවන හෝමෝන් වෙනස නිසා කෙස් වැඩීමේ චක්‍රයේ ඇතිවන තාවකාලික වෙනස් වීමකි.

අධික ලෙස බ්‍රස් කිරීමෙන් කෙස් පහසුවෙන් ඉවත් කර ගත හැකි වන අතර කෙස් වැටීමට ගන්නා මාස දෙක හෝ තුන කාලය වේගවත් කර ගත හැක. කෙසේ වෙතත් මෙයින් කෙස් වලට හානියක් සිදු නොවේ. විටමින් ජාති ගැනීමෙන් හෝ පිළියෙල කල යමක් කෙස් මසට පිරිමැදීමෙන් වෙනසක් ඇති නොවේ. සමහර ස්ත්‍රීන්ට Postpartum කෙස් හැලීම ගර්භනීය අවස්ථාවෙන් පසුවද ඇතිවන බව දකිනවා ඇත.

## Singhalese - Postpartum Hair Loss

### වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ පවුලේ දොස්තර මයා/මිය

ඔබේ ප්‍රසව විශේෂඥයා (obstetrician)

© 2002, Department of Dermatology, St. Vincent’s Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.